22752

සියලුම හිමිකම් ඇවිරිණි.
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්තළම්
Department of Education – Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்ராதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade: 11	විෂයය பாடம் Subject: **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**	පත්‍රය வினாத்தாள் Paper: **I**	කාලය காலம் Time: **පැය 1යි.**

නම / අනු අංකය : .....

සැලකිය යුතුයි:

i) **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ii) **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**

iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

01. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට අවශ්‍ය විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හා සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තක් හඳුන්වන්නේ,

1) වෙළෙඳාම් ලෙස ය.
2) බෙදාහැරීම ලෙස ය.
3) ව්‍යාපාර ලෙස ය.
4) නිෂ්පාදිත ලෙස ය.

02. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව හා අරමුණු දක්වෙන පහත තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

ඇල්මැති පාර්ශව	අරමුණු
1. අයිතිකරුවෝ	A - තීරණ ගැනීම
2. කළමනාකරුවෝ	B - ව්‍යාපාරයේ අනාගත වර්ධනය
3. රජය	C - නිෂ්පාදිත මිල තීරණය කිරීම
4. තරගකරුවෝ	D - රැකියා අවස්ථා උත්පාදනය කිරීම

1) BADC 2) ABCD 3) DABC 4) CBAD

03. අභ්‍යන්තර පරිසර සාධක ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1) අයිතිකරුවෝ - තරගකරුවෝ - සේවකයෝ
2) අයිතිකරුවෝ - කළමනාකරුවෝ - සැපයුම්කරුවෝ
3) අයිතිකරුවෝ - ගනුදෙනුකරුවෝ - තරගකරුවෝ
4) අයිතිකරුවෝ - කළමනාකරුවෝ - සේවකයෝ

04. 2025 අයවැය තුළින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල මුදලක් වෙන් කරන ලදී. මෙම ප්‍රකාශය තුළ ඔබ දකින ව්‍යාපාර පරිසරය තෝරන්න.

1) ආර්ථික පරිසරය
2) තාක්ෂණික පරිසරය
3) නෛතික පරිසරය
4) දේශපාලන පරිසරය

Past Papers Wiki

05. A - ඉතුරුම් ප්‍රමාණය ඉහළ යාම ආයෝජන වර්ධනයට හේතු වේ.
B - පොළී අනුපාතය වෙනස් කිරීම තුළින් රටක මුදල් සංසරණය පාලනය කළ නොහැක.
C - රටක නිෂ්පාදනය වැඩි නොවී ආදායම් ඉහළ යාම උද්ධමනයට හේතු වේ.
D - ගෝලීය පරිසරය නිසා විදේශීය ප්‍රාග්ධනය රට තුළට නොලැබේ.

ඉහත ප්‍රකාශ තුළින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) A හා C 2) A හා B 3) B හා C 4) C හා D

06. නීතිඥයන්, ගණකාධිකාරිවරු, වෛද්‍යවරු වැනි වෘත්තිකයන් පවත්වාගෙන යන ව්‍යාපාර සංවිධානය වන්නේ,

1) තනි ව්‍යාපාර 2) සමාගම් 3) සංස්ථා 4) හවුල් ව්‍යාපාර

07. නිවැරදි ගැලපීම තෝරන්න.

A	B
1. අවසාන පරිභෝජනයට භාණ්ඩ අලෙවි කිරීම	A තොග වෙළෙඳාම
2. නැවත විකිණීම සඳහා අලෙවි කිරීම	B සිල්ලර වෙළෙඳාම
3. පරිප්පු තොගයක් පකිස්ථානයෙන් මිලදී ගැනීම	C අපනයන වෙළෙඳාම
4. ඇඟලුම් තොගයක් ඇමරිකාවට විකිණීම	D ආනයන වෙළෙඳාම

1) ABCD 2) DBAC 3) CADB 4) BADC

08. නීතිමය කටයුතු වලදී ආයතන ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ.

1) තනි පුද්ගල ව්‍යාපාර 2) සංස්ථාපිත සමාගම්
3) රාජ්‍ය සංස්ථා 4) රාජ්‍ය දෙපාර්තමේන්තු

09. චෙක්පතක චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ (MICR) ඇතුළත් අංකයක් නොවන්නේ,

1) චෙක්පත් අංකය 2) බැංකු ශාඛා අංකය
3) ඉන්වොයිස් අංකය 4) බැංකු ජංගම ගිණුම් අංකය

10. රක්ෂණයට සම්බන්ධ වන පාර්ශ්ව අතරින් පළමු පාර්ශවය වන්නේ,

1) රක්ෂණාවරණය ලබා දෙන පාර්ශවය යි.
2) රක්ෂණාවරණය ලබන පාර්ශවය යි.
3) රක්ෂණ ගිවිසුමෙන් බලපෑමක් වන අනෙකුත් සියලුම පාර්ශවය යි.
4) ඉහත කිසිවක් නොවේ.

11. සන්නිවේදන කටයුතු සඳහා යොදා ගන්නා සන්නිවේදන මාධ්‍යක් නොවන්නේ,

1) විද්‍යුත් 2) විද්‍යුත් තැපෑල
3) ලිඛිත 4) සංකේත හා සංඥා

12. සුදුසු ප්‍රවාහන මාධ්‍යක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක ඇතුළත් පිළිතුර නොවන්නේ,

1) පිරිවැය, ධාරිතාව, සුලභත්වය, වේගය
2) ධාරිතාවය, සුලභත්වය, වේගය, ආරක්ෂාව
3) සුලභත්වය, වේගය, ආරක්ෂාව, භාණ්ඩයේ ස්වභාවය
4) වේගය, ආරක්ෂාව, ධාරිතාවය, මාධ්‍ය සඳහා යොදාගන්නා බලය

13. සිල්ලර වෙළෙඳාමක් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

1) ආපනශාලාවකට පැටිස් 200ක් මිල දී ගැනීම.
2) චිත්‍ර ශිල්පියෙකු විසින් ලක්සලට බිත්ති සැරසිල්ලක් විකිණීම.
3) පුරාණ විහාරයේ දන්සැල සඳහා සහල් 100kg ක් විකිණීම
4) ශානිකා ලී බඩු වෙළෙන්දෝ විසින් අල්මාරියක් ලී බඩු වෙළෙඳ සැලකට විකිණීම.

14. විදුහල්පතිතුමා ශිෂ්‍ය නායකයින් පත්කර, මවුන්ට පාසලේ අධීක්ෂණ කටයුතු පවරයි. මෙය අයත් වන කළමනාකරණ කාර්යය කුමක් ද?

1) සැලසුම්කරණය 2) සංවිධානකරණය 3) මෙහෙයවීම 4) පාලනය

15. ආයෝජන මාර්ග 3ක් පහත දැක්වේ.

A - රු. 25,000 ක මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුව

B - රු. 100,000 ක කොටස් වෙළෙඳපොළ ආයෝජන

C - රු. 200,000 ක භාණ්ඩාගාර බිල්පත්වල අයෝජන

ඉහත ආයෝජන, අවදානම වැඩිම ආයෝජනයේ සිට අවදානම අඩුම ආයෝජනය දක්වා පෙළගැස්වූ විට පිළිතුර කුමක් ද?

1) B, A, C 2) B, C, A 3) C, A, B 4) C, B, A

16. ආයෝජන සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) ආයෝජනයක අවදානම වැඩි වන විට එහි ප්‍රතිලාභය අඩු වෙයි.

2) කොටස් වෙළෙඳපොළ ආයෝජනයෙන් ඉහළ පොලී ආදායමක් ලබා ගත හැකිය.

3) ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම ආයෝජන මාර්ගයක් ලෙස නොසැලකේ.

4) අරමුදල් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායී මාර්ගයක යෙදවීම ආයෝජනයයි.

17. "වැඩි වීම හර" , "අඩු වීම බැර" යන ද්විත්ව සටහන මූලධර්මය පිළිවෙලින් අදාළ වන ගිණුම් යුගලය අඩංගු පිළිතුර වනුයේ.

1) කොමිස් වියදම් ගිණුම්, කොමිස් ආදායම් ගිණුම

2) ගොඩනැගිලි ගිණුම, බැංකු ණය ගිණුම

3) ගැනිලි ගිණුම, මුදල් ගිණුම

4) ගැනුම් ගිණුම, පොලී ආදායම් ගිණුම

18. ව්‍යාපාරයක "ගැනිලි" අයත් වන ගිණුම් වර්ගය වන්නේ,

1) වත්කම් ගිණුම් 2) වියදම් ගිණුම් 3) වගකීම් ගිණුම් 4) හිමිකම් ගිණුම්

➢ **පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 19 සිට 21 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - අයිතිකරු ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 300,000 ක් ව්‍යාපාරයට යෙදවීම.

B - ණයට භාණ්ඩ ගැනීම රු. 60,000

C - අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 5,000

D - අයිතිකරුගේ නිවසේ විදුලි බිල රු. 3,000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.

E - රු. 30,000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 50,000 කට ණයට විකිණීම.

19. ඉහත ගනුදෙනු අවසානයේ දී ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය (වත්කම් = හිමිකම් + වගකීම්) වනුයේ,

1) 377,000 = 317,000 + 60,000 2) 372,000 = 312,000 + 60,000

3) 402,000 = 342,000 + 60,000 4) 372,000 = 300,000 + 72,000

20. ඉහත ගනුදෙනු අතුරින් ව්‍යාපාරයේ හිමිකම වැඩි වීමට බලපාන ගනුදෙනු ඇතුළත් පිළිතුර වනුයේ,

1) C සහ E 2) A සහ A 3) B සහ C 4) A සහ E

21. ඉහත සියලුම ගනුදෙනු අවසානයේ දී (A, B, C, D සහ E ගනුදෙනු වලින් පසුව) අයිතිකරු සිය පෞද්ගලික මුදලින් ණය හිමියන්ට රු. 50,000 ක් ගෙවූ විට ව්‍යාපාරයේ අවසාන ගිණුම්කරණ සමීකරණය වනුයේ,

1) 322,000 = 312,000 + 10,000 2) 372,000 = 312,000 + 60,000

3) 372,000 = 362,000 + 10,000 4) 322,000 = 212,000 + 110,000

PAST PAPERS WIKI

22. මෝටර් රථ වෙළෙඳාමේ යෙදෙන "මෝටර් රථ ආනයන සමාගම" (Vehicle Import Company) සිය කාර්යාල ප්‍රයෝජනය සඳහා ඉන්ද්‍රා ට්‍රේඩර්ස් වෙතින් මෝටර් රථයක් රු. 5,000,000 කට ගෙන ඇත. මෙම ගනුදෙනුව මෝටර් රථ ආනයන සමාගමේ පොත්වල සටහන් කරන ආකාරය (ද්විත්ව සටහන) වන්නේ,

1) යැනුම් ගිණුම හර (රු.) 5,000,000
මුදල් ගිණුම බැර (රු.) 5,000,000

2) මෝටර් රථ ගිණුම හර (රු.) 5,000,000
මුදල් ගිණුම බැර (රු.) 5,000,000

3) මුදල් ගිණුම හර (රු.) 5,000,000
විකුණුම් ගිණුම බැර (රු.) 5,000,000

4) මෝටර් රථ ගිණුම හර (රු.) 5,000,000
ඉන්ද්‍රා ට්‍රේඩර්ස් බැර (රු.) 5,000,000

23. ණයගැතියෙකුගෙන් ලැබී තිබුණු රු. 25,000 ක චෙක්පත බැංකු ගිණුමේ තැන්පත් කළ පසු අගරු විය. එම අගරු වීම සටහන් කිරීමේ දී තැබිය යුතු නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1) බැංකු ගිණුම හර (රු) 25,000
ණයගැති ගිණුම බැර (රු) 25,000

2) බැංකු ගිණුම හර (රු) 25,000
මුදල් ගිණුම බැර (රු) 25,000

3) ණයගැති ගිණුම හර (රු) 25,000
බැංකු ගිණුම බැර (රු) 25,000

4) මුදල් ගිණුම හර (රු) 25,000
බැංකු ගිණුම බැර (රු) 25,000

24. ව්‍යාපාරයක මුදල් පොතේ හර පැත්තේ වට්ටම් හිරුවේ එකතුව අදාළ ගිණුමේ සටහන් කිරීම දක්වෙන ද්විත්ව සටහන් රීතිය වන්නේ,

1) වියදම් වැඩි වීම හර
2) ආදායම් වැඩි වීම බැර
3) වියදම් අඩු වීම හර
4) හිමිකම් අඩු වීම හර

25. යම භාණ්ඩ වෙළෙඳ ව්‍යාපාරයක පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුවක් වන්නේ,
1) රු. 200,000 ක ලී බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම ය.
2) රු. 200,000 ක ලී බඩු තොගයක් ණයට ගැනීම ය.
3) රු. 200,000 ක ලී බඩු තොගයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ණයට ගැනීම ය.
4) රු. 200,000 ක ලී බඩු තොගයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා අත්පිට මුදලට ගැනීම ය.

26. ව්‍යාපාරයක සුළු මුදල් භාරකරුට 2024.04.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 7,500 ක් ලැබුණි. 2024.04.30 දින සුළු මුදල් පොතේ සුළු වියදම් හිරුවේ මුළු එකතුව රු. 8,500 ක් වූ අතර එදිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 1,500 ක් විය. 2024.03.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය වන්නේ,

1) රු. 1,500 කි. 2) රු. 2,500 කි. 3) රු. 8,500 කි. 4) රු. 10,000 කි.

27. ණයැගති නයනාගෙන් 2025.04.15 දින ව්‍යාපාරයට ලැබුණු රු. 20,000 ක චෙක්පත, 2025.04.20 දින බැංකුවේ තැන්පත් කරන ලදී. චෙක්පත බැංකුවේ තැන්පත් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

1) මුදල් ගිණුම හර රු. 20,000
බැංකු ගිණුම බැර රු. 20,000

2) බැංකු ගිණුම හර රු. 20,000
නයනාගේ ගිණුම බැර රු. 20,000

3) බැංකු ගිණුම හර රු. 20,000
මුදල් ගිණුම බැර රු. 20,000

4) මුදල් ගිණුම හර රු. 20,000
නයනාගේ ගිණුම බැර රු. 20,000

28. ව්‍යාපාරයක බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේ දී යොදා ගන්නා අයිතම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) ණයගැති ප්‍රේෂණ, ස්ථාවර නියෝග මත ගෙවීම්
2) ණයගැති ප්‍රේෂණ, තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
3) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්, නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්
4) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්, ස්ථාවර නියෝග මත ගෙවීම්

29. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශනයේ ශේෂය අඩු වීමට හේතු වන ගනුදෙනුව කුමක් ද?
1) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 20,000
2) නැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 15,000
3) බැංකුවට සෘජුවම ලැබුණු ලාභාංශ ආදායම රු. 5,000
4) ණයගැනි ප්‍රේෂණ රු. 3,000

30. එකමුතු ක්‍රීඩා සමාජයේ 2025 වර්ෂයේ මුළු ආදායම රු. 460,000 ක් වූ අතර, මුළු වියදම රු. 360,000 ක් විය. ඒ අනුව 2025 වර්ෂය සඳහා එකමුතු ක්‍රීඩා සමාජය උපයා ඇත්තේ,
1) රු. 460,000 ක අතිරික්තයකි.
2) රු. 360,000 ක ඌනතාවයකි.
3) රු. 100,000 ක අතිරික්තයකි.
4) රු. 100,000 ක ඌනතාවයකි.

➢ **පහත සිද්ධිය භාවිතයෙන් 31 සහ 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන යන විදුරට රු. 45,000 ක් දක්වා අයිරා පහසුකමක් ලබා ගැනීමට ඔහුගේ වාණිජ බැංකුව අනුමැතිය ලබා දී ඇත. ඔහුගේ බැංකු ගිණුමේ ශේෂය රු. 18,000 ක් ව තිබිය දී අයිතිකරු වන විදුර නිකුත් කළ චෙක්පතකට බැංකුව් රු. 30,000 ක් ගෙවා ඇති අතර එයට අමතර ව ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති බැංකු ණය මුදල රු. 20,000 කි. ඒ අනුව,

31. විදුර ලබාගෙන ඇති බැංකු අයිරාවේ වටිනාකම වනුයේ,
1) රු. 30,000 2) රු. 20,000 3) රු. 32,000 4) රු. 45,000

32. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති බැංකු ණය සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත සටහන වනුයේ,

1) බැංකු ගිණුම් හර (රු.) 20,000
බැංකු ණය ගිණුම බැර (රු.) 20,000

2) බැංකු ණය ගිණුම් හර (රු.) 20,000
බැංකු ගිණුම බැර (රු.) 20,000

3) බැංකු ණය ගිණුම හර. (රු.) 20,000
මුදල් ගිණුම බැර (රු.) 20,000

4) මුදල් ගිණුම හර (රු.) 20,000
බැංකු ගිණුම බැර (රු.) 20,000

33. ව්‍යාපාරයක් ලකුණු කළ මිල රු. 160,000 ක් වූ භාණ්ඩයක් ණයට විකිණීමේ දී රු. 10,000 ක වෙළෙඳ වට්ටමක් ලබා දුන් අතර ණය බේරුම් කිරීමේ දී 10% ක මුදල් වට්ටමක් ද ලබාදුනි. ව්‍යාපාරයේ පොත්වල ගිණුම්ගත කළ යුතු මුළු වට්ටම් ප්‍රමාණය වනුයේ,
1) රු. 26,000 2) රු. 25,000 3) රු. 15,000 4) රු. 10,000

34. පුංචි තරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 150 කි. මාසික සාමාජික ගාස්තුව රු. 50 ක් වන අතර සාමාජිකයින් 20 දෙනෙකු 2024 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නොමැත. මෙම ක්‍රීඩා සමාජයේ 2024 වර්ෂය අවසානයේ පිළියෙල කරනු ලබන ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කරන සාමාජික මුදල වනුයේ,
1) රු. 6,500 කි. 2) රු. 7,500 කි. 3) රු. 78,000 කි. 4) රු. 90,000 කි.

35. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක ආදායම් හා වියදම් ගිණුම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) පරිත්‍යාග ලැබීම් ආදායම් හා වියදම් ගිණුමේ හර පැත්තේ සටහන් කරයි.
2) සියලුම මුදල් ලැබීම් හා ගෙවීම් ආදායම් හා වියදම් ගිණුමේ සටහන් කරයි.
3) කාලච්ඡේදය තුළ මුදලින් ලද සාමාජික මුදල් පමණක් ආදායම් හා වියදම් ගිණුමේ සටහන් කරයි.
4) ආදායම් හා වියදම් ගිණුමේ ශේෂය අතිරික්තය හෝ ඌනතාව ලෙස හඳුන්වයි.

Past Papers Wiki

➢ **පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අගාතිගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
තොගය (2025.01.01 දිනට)	20,000	
ගැනුම්	200,000	
විකුණුම්		343,000
බෙදාහැරීමේ වෑන් රථය (පිරිවැයට)	500,000	
බෙදාහැරීමේ වෑන් රථය ක්ෂය වෙන් කිරීම් (2025.01.01 දිනට)		100,000
ගෙන ඒමේ කුලී	9,000	
දුන් වට්ටම්	1,200	
ගෙන යාමේ කුලී	14,000	
ගොඩනැගිලි කුලී	24,000	
10% බැංකු ණය		100,000
විදුලි ගාස්තු	12,500	
පරිපාලන වේතන	25,000	
බැංකු අයිරාව		12,700
ප්‍රාග්ධනය		250,000
	805,700	805,700

අමතර තොරතුරු:

1. 2025.12.31 දිනට තොගය රු. 30,000 කි.
2. බෙදාහැරීමේ වෑන් රථය සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව 10% බැගින් ක්ෂය කළ යුතුය.

36. මෙම ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,
1) රු. 179,000 කි. 2) රු. 190,000 කි. 3) රු. 199,000 කි. 4) රු. 229,000 කි.

37. මෙම ව්‍යාපාරයේ ජංගම වගකීමක් වන්නේ,
1) බැංකු අයිරාව ය. 2) බැංකු ණය ය.
3) බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම ය. 4) ප්‍රාග්ධනය ය.

38. මෙම ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දක්වෙන මූල්‍ය හා වෙනත් ව්‍යවහාරවල එකතුව වනුයේ,
1) රු. 1,200 කි. 2) රු. 10,000 කි. 3) රු. 11,200 කි. 4) රු. 22,700 කි.

39. මෙම ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දක්වෙන බෙදාහැරීමේ රථ ක්ෂය වටිනාකම වනුයේ,
1) රු. 50,000 කි. 2) රු. 100,000 කි. 3) රු. 150,000 කි. 4) රු. 550,000 කි.

40. මෙම ව්‍යාපාරයේ 2025.12.31 දිනට ජංගම නොවන වත්කම්වල ශුද්ධ අගය වනුයේ,
1) රු. 50,000 කි. 2) රු. 350,000 කි. 3) රු. 400,000 කි. 4) රු. 500,000 කි.

සියලුම හිමිකම් ඇවිරිණි.
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டுறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade: 11	විෂයය பாடம் Subject: වාණිජ හා ගිණුම්කරණ අධ්‍යයනය	පත්‍රය வினாத்தாள் Paper: II	කාලය காலம் Time: පැය 2යි.

සැලකිය යුතුයි:
- **පළමු ප්‍රශ්න අනිවාර්යය වේ.**
- **I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දුම්බර ප්‍රදේශයේ පදිංචි අකේෂි හා අමාෂි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව උපාධිය නිම කිරීමෙන් පසු රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටී. ඒ අතර තම ගම් ප්‍රදේශයේ ස්වභාවික සම්පතක් ලෙස වැඩි වශයෙන් දක්නට ලැබෙන 'පන්' ආධාර කරගෙන දෙදෙනා සතු දැනුම ද උපයෝගී කරගනිමින් 2026.01.01 දින තම නිවස ඉදිරිපිට පිහිටි කඩකාමරයේ "රූ රටා" නමින් හිස්වැසුම්, මුදල් පසුම්බි, බෑග් නිෂ්පාදනයට පෙළඹුනි. ආරම්භයේ දී දෙදෙනාගේ ම ඉතිරි කිරීමේ ගිණුම් සතුව තිබූ රු. 500,000 බැගින් ව්‍යාපාරයට යොදවන ලදී. එදිනම රු. 200,000ක් වටිනා යන්ත්‍රයක් අමාෂි විසින් ප්‍රාග්ධනය ලෙස රැගෙන එන ලදී. මේ දිනවල පවතින අධික රස්නය නිසා හිස්වැසුම් වලට තියෙන ඉල්ලුම වැඩි විය.

මේ නිසා ගමේ සිටින නිර්මාණශීලී තරුණියන් දෙදෙනෙකු රු. 30,000 බැගින් වැටුපකට බඳවා ගන්නා ලදී. ව්‍යාපාරය ක්‍රමයෙන් දියුණුවත් ම සංචාරක පුරයක් වන ගාල්ල, මීගමුව අවට ද හෝටල් කිහිපයකට අලෙවිය සඳහා හිස්වැසුම්, මුදල් පසුම්බි, බෑග් ඉදිරිපත් කරන ලදී. මේ සඳහා විදේශීය සංචාරකයින්ගේ ඉල්ලුම ද ඉහා ඉහළ මට්ටමින් දැකගත හැකි විය. මෙහිදී සැලසුම් කළ පරිදි ගුණාත්මයෙන් යුතු නිෂ්පාදිත බිහි වන්නේ දැයි අකේෂි හා අමාෂි නිතරම සොයා බැලීය. 2026.02.01 ව්‍යාපාරයේ ශාඛාවක් ආරම්භ කිරීමට අවශ්‍ය රු. 200,000ක ණය මුදලක් සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමයක් මගින් 5%ක පොලියකට ලබා ගන්නා ලදී.

ඉදිරියේ දී ආරම්භ කිරීමට අදහස් කරන ශාඛාව අඛණ්ඩ පැවැත්මකින් හා නෛතික පුද්ගලභාවයකින් සමන්විත වීම වඩා යෝග්‍ය බව අකේෂිගේ අදහස විය.

ජනවාරි මාසයේ මෙම ව්‍යාපාරයේ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

ජංගම ගිණුමක් ආරම්භ කර මුදල් තැන්පත් කළා	100,000
අමුද්‍රව්‍ය ගැනුම්	150,000
සේවක වැටුප් ගෙවීම්	60,000
ප්‍රවාහන වියදම්	40,000
විදුලි ගාස්තු	5,000
අනෙකුත් සේවා ගාස්තු	2,000
උපචිත විදුලි ගාස්තු	2,000

යන්ත්‍ර පාර්ශ්වකව 12% බැගින් ක්ෂය කළ යුතුය. පළමු මාසය තුළ නිෂ්පාදිත අලෙවියෙන් රු. 600,000 ආදායමක් ලද අතර ඉතිරි නිෂ්පාදිත කිසිවක් නොවිය.

i) අ) ''රූ රථා'' ව්‍යාපාරය සඳහා මිනිස් අවශ්‍යතාව කුමක් ද?

ආ) අරමුණු අනුව ''රූ රථා'' ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට ද?

ii) අ) ව්‍යාපාරයේ සඳහන් බාහිර පරිසර සාධක 2 ක් ලියන්න.

ආ) ඉහත සිද්ධියේ සඳහන් තොග වෙළෙඳාමට නිදසුනක් දක්වන්න.

iii) අ) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව මෙම ව්‍යාපාර පරිමාණය අනුව වර්ග කර දක්වන්න.

ආ) ඊට හේතුව පහදන්න.

iv) අ) මෙහි සඳහන් කළමනාකරණ කාර්යයක් දක්වන්න.

ආ) සිද්ධිය ඇසුරින් ඊට නිදසුනක් දක්වන්න.

v) අ) මෙම සිද්ධියේ ජංගම ගිණුමක් ආරම්භ කිරීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

ආ) මෙම ව්‍යාපාරයේ මාසික යන්ත්‍ර ක්ෂය ගිණුම් ගත කිරීමට අදාළ ජ'නල් සටහන ලියා දක්වන්න.

vi) 1/31 දිනට ''රූ රථා'' ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

vii) අ) 2026/01/31 දිනට ව්‍යාපාරයේ උපචිත විදුලිය සටහන් මූලික පොත නම් කරන්න.

ආ) උපචිත විදුලියට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

viii) අ) 1/31 දිනට ජංගම නොවන වත්කමක් අගයක් සහිතව දක්වන්න.

ආ) මෙම ව්‍යාපාරය පවත්වන මූලික සටහන් පොත් දෙකකට අදාළ මූලාශ්‍ර ලියවිලි 2ක් නම් කරන්න.

ix) ''රූ රථා'' ව්‍යාපාරයේ පළමු මාසයට අදාළ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

x) අ) 1/31 දිනට අයිතිකරුවන්ගේ හිමිකම ගණනය කරන්න.

ආ) අකේෂි සහ අමාෂිගේ හිමිකම අඩුවීමට හා වැඩි වීමට අදාළ අවස්ථා 2ක් සිද්ධිය ඇසුරින් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20යි)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02) i) අ) ව්‍යාපාරයක් යන්න අර්ථ දක්වන්න.

ආ) ව්‍යාපාර කටයුතුවල නියැලීමෙන් ව්‍යාපාර අපේක්ෂා කරන පොදු අරමුණු 02ක් ලියන්න.

ii) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) නිෂ්පාදන කාර්යයේ දී යොදා ගන්නා කර්මාන්තශාලාව නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් ය.

ආ) ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් එම ව්‍යාපාරයට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිය.

ඉ) සංස්ථාපිත සමාගම ප්‍රාග්ධනය රැස්කර ගන්නේ කොටස් නිකුත් කිරීමෙනි.

ඊ) නැවත විකිණීම සඳහා භාණ්ඩ හා සේවා මිල දී ගන්නා පාරිභෝගිකයා වේ.

iii) අ) ආර්ථික පරිසර සාධකයක් ලෙස ''උද්ධමනය'' යන්න පැහැදිලි කරන්න.

ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන වාසි 02ක් දක්වන්න.

iv) රාධා ප්‍රධාන පාසල් කීපයක් ආසන්න ස්ථානයක පාසල් ලිපිද්‍රව්‍ය මුද්‍රිත පොත්පත් අලෙවි කිරීමේ වෙළෙඳසැලක් පවත්වාගෙන යයි. දෛනික ලිපිද්‍රව්‍ය මිලට ගැනීමට එන පාසල් සිසුන් සඛ්‍යාව වැඩි වෙමින් පවතී.

අ) රාධා ව්‍යාපාරයට ඇති අවස්ථාවක් නම් කරන්න.

ආ) ඇයගේ ව්‍යාපාරයේ නිබිය නැති යයි නිගමනය කළ හැකි දුර්වලතාවයක් නම් කරන්න.

(ලකුණු 2 x 4 = 8යි)

i) අ) උපකාරක සේවා යනු කුමක් ද?

ආ) තොග වෙළෙඳාමේ දක්නට ලැබෙන ලක්ෂණ 02ක් දක්වන්න.

ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) ශ්‍රී ලංකාවේ නිපදවන පොල්කටු ආශ්‍රිත නිෂ්පාදිත විදේශීය රටවලට අලෙවි කිරීම අපනයන වෙළෙඳාම වේ.

ආ) චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ මුලින් ම සඳහන් වන්නේ බැංකුවේ අංකයයි.

ඉ) රක්ෂණයේ අරමුණ අවදානම් අවම කිරීමයි.

ඊ) චෙක්පතක අණලදු සෑම විටම වාණිජ බැංකුවකි.

iii) අ) "චෙක්පතක් පිටසන් කිරීම" යන්න පැහැදිලි කරන්න.

ආ) චෙක්පතක් අගරු විය හැකි අවස්ථා 2ක් නම් කරන්න.

iv) අ) සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක 02ක් සඳහන් කරන්න.

ආ) විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවේ දක්නට ලැබෙන සීමාවන් 02ක් දක්වන්න.

(ලකුණු 2 x 4 = 8යි)

4) i) අ) භාණ්ඩාගාර බිල්පතක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

ආ) ආයෝජකයකු හට සාමාන්‍ය කොටස්වල මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ 02ක් සඳහන් කරන්න.

ii) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) ව්‍යාපාරයේ සම්පත් අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීම කාර්යක්ෂමතාව වේ.

ආ) ආයෝජනයක අවදානම ඉහළ යනවිට ඉන් ලැබෙන ප්‍රතිලාභ පහළ යයි.

ඉ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂනීය ලෙස මෙන් ම ලාභදායී ලෙස තෘප්තිමත් කළ හැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළෙඳපොළ වේ.

ඊ) සැලසුම්කරණය යනු ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලියයි.

iii) ඉෂේන් පිළිගත් ව්‍යාපාරයක අලෙවි කළමනාකරු ලෙස සේවය කරයි. ඔහු විසින් ඉටු කරන ලද කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A. නිෂ්පාදිතයක් බෙදාහැරීම සඳහා ශීතාගාර පහසුකම් ඇති ලොරි රථයක් මිල දී ගැනීම.

B. දැනට නිපදවා ඇති නිෂ්පාදිතවල දැවටුම තීරණය කිරීමට තීරණය කිරීම.

C. නව නිෂ්පාදිත නිපදවීමෙන් අපේක්ෂා කළ විකුණුම් ආදායම් උපයා ඇත්දැයි සොයා බැලීම.

D. පාරිභෝගිකයින් සමඟ ආකර්ෂනීය ලෙස සබඳතා පවත්වා ගැනීමට විකුණුම් සේවකයින්ට උපදෙස් දීම.

ඉහත එක් එක් කාර්යය කුමන කළමනාකරණ කාර්යයට අයත් දැයි නම් කරන්න.

iv) අ) ආයෝජනයේ ප්‍රතිලාභ ලෙස "ප්‍රාග්ධන ලාභ" ලැබෙන ආයෝජන මාර්ග 02ක් ලියන්න.

ආ) ජංගම ගිණුමක මුදල් තැන්පත් කිරීම ආයෝජන මාර්ගයක් ලෙස සැලකෙන්නේ ද? ඔබේ පිළිතුරට හේතුව කුමක් ද?

(ලකුණු 2 x 4 = 8යි)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

05) i) අ) **ගිණුම්කරණ** තොරතුරු පරිශීලනය කරනු ලබන පාර්ශව දෙකක් සඳහන් කරන්න.

ආ) **ගිණුම්කරණ** සමීකරණයේ වත්කම්වලට පමණක් බලපාන (වත්කම් පමණක් වෙනස් වන) ගනුදෙනුවක් ලියන්න. (ලකුණු 02යි)

ii) පහත දැක්වෙන්නේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු දෙකකි.

අ) රු. 200,000 ක බැංකු ණයක් ලබා ගැනීම.

ආ) රු. 5,000ක භාණ්ඩ ටාමරට ණයට විකිණීම. (ලකුණු 02යි)

ඉහත එක් එක් ගනුදෙනුවේ ද්විත්ව සටහන සඳහන් කරන්න.

iii) පරිගණක අලෙවිකරණ වසන්තගේ ව්‍යාපාරයේ 2026 මැයි 31 දිනෙන් අවසන් වූ මාසයේ සිදුවූ ගනුදෙනු කිපයක් ගිණුම්කරණ සමීකරණය තුළ පහත පරිදි දක්වා ඇත.

	වත්කම්	=	හිමිකම්	+	වගකීම්	
	කාර්. උප.	තොගය	ණයගැති	මුදල්	හිමිකම්	බැංකු ණය	ණයහිමියෝ
2026.05.01 දිනට ශේෂය	200,000	20,000	40,000	28,000	?	150,000	31,000
(1)		+12,000					+12,000
(2)				-9,000	-1,000	-8,000	
(3)			-10,000	+8,000	-2,000		
(4)		-5,000		-7,500	+2,500		

අ) ඉහත මාසය තුළ සිදු වූ ඇති ගනුදෙනු එකින් එක අගයන් සහිතව සඳහන් කරන්න.

ආ) 1. ආරම්භක දිනට (2026.05.01) හිමිකම ගණනය කරන්න.

2. ව්‍යාපාරයේ 2025.05.31 දිනට

A - ජංගම වත්කම්වල අගය

B - ජංගම නොවන වගකීම්වල අගය

C - හිමිකමේ අගය ගණනය කරන්න. (ලකුණු 04යි)

iv) 2026 මැයි මාසයේ අශාන්ගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

දිනය	ගනුදෙනුව	මූලාශ්‍ර ලේඛනය
05/03	එකක් රු. 150 බැගින් බිස්කට් පැකට් 20ක් අමල්ගෙන් ණයට ගැනීම.	ඉන්. අංකය 512
05/04	එකක් රු. 35 බැගින් අභ්‍යාස පොත් 50ක් අත්පිට මිලදී ගැනීම.	ලදුපත් අංකය 30
05/12	එකක් රු. 20,000 බැගින් භාණ්ඩ ඇසිරීමේ රාක්ක 2 ක් දම්රෝ ආයතනයෙන් ණයට ගැනීම.	ජර්නල් වවුචර් අංක 310
05/15	එකක් රු. 70 බැගින් සහල් කිලෝ 50ක් ජාලිය ව්‍යාපාරයේ ණයට ගැනීම.	ඉන්. අංකය 818
05/21	එකක් රු. 95 බැගින් සීනි කිලෝ 2ක් විමල්ට ණයට විකිණීම	ඉන්. අංකය 915

අවශ්‍ය වන්නේ,

අ) 2026 මැයි මාසය සඳහා අශාන්ගේ ව්‍යාපාරයේ ගැනුම් ජර්නලය පිළියෙල කිරීම.

ආ) 2026.05.31 දිනට ගැනුම් ජර්නලයේ ගනුදෙනු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම (ලකුණු 04යි)

(මුළු ලකුණු 12 යි)

06) i) අ) ගිණුම්කරණයේ වැරදි සිදුවන අවස්ථා 02ක් ලියන්න.

ආ) නිෂ්පාදින ඒකකයක විකුණුම් මිල තීරණය කිරීමේ දී සලකා බලන සාධක 02ක් ලියන්න. (ලකුණු 02යි)

ii) බෝනික්කන් නිෂ්පාදනය කරන "සිඟිති සිනා" ව්‍යාපාරයේ 2026 අගෝස්තු මාසයට අදාළ නොරතුරු කිහිපයක් පහත දක්වේ.

බෝනික්කෙකුගේ පිරිවැය	3,000
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	200,000
මුළු නිෂ්පාදන පිරිවැය	600,000
සෘජු ද්‍රව්‍ය පිරිවැය	150,000
සෘජු වෙනත් වියදම්	100,000

අවශ්‍ය වන්නේ,

අ) අගෝස්තු මාසය තුළ නිෂ්පාදනය කළ බෝනික්කන් ගණන

ආ) අගෝස්තු මාසය සඳහා සෘජු ශ්‍රම පිරිවැය (ලකුණු 02යි)

iii) විහංගාගේ ව්‍යාපාරයේ 2025 සැප්තැම්බර් මාසයේ වාසිදායක ශේෂය රු. 100,000 කි. එහෙත් බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය හා මෙය නොගැලපුණි. වෙනසට හේතු පහත පරිදි වේ.

* විහංගාගේ ව්‍යාපාරය නිතුන් කළ 2025.09.30 දින වන විටත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්
  - චෙක් අංක A480 16,000
  - චෙක් අංක A500 32,000
* බැංකුවේ තැන්පත් කළ නමුත් 2025.03.30 දින වන විටත් නිෂ්කාශනය නොවූ චෙක්
  - චෙක් අංක B143 50,000
  - චෙක් අංක B159 28,000
* ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ වාරිකය රු. 26,000කි.
* බැංකුවට ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 26,000

අවශ්‍ය වන්නේ,

අ) 2025.03.30 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

ආ) 2025.09.30 දිනට ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය (ලකුණු 04යි)

iv) සිතුමිගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ හර ශේෂය රු. 2,500 කි. පසුව ගිණුම් පොත් පරීක්ෂා කිරීමේදී පහත වැරදි සිදු වී ඇති බව අනාවරණය විය.

අ) රු. 7,500ක අන්පිට විකුණුම් රුග 7,000ක් ලෙස විකුණුම් ගිණුමට සටහන් වී නිබීම.

ආ) රු. 3,000ක දුරකථන ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම.

ඉ) අමල්ගෙන් ලද රු. 15,000ක මුදල නිමල්ගේ ගිණුමට සටහන් වී නිබීම.

අවශ්‍ය වන්නේ,

අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් (ලකුණු 04යි)

ආ) අවිනිශ්චිත ගිණුම (මුළු ලකුණු 12යි)

07) i) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක පිළියෙල කරන මූලික ප්‍රකාශන දෙකක් නම් කරන්න. (ලකුණු 02යි)

ii) එක්සත් ක්‍රීඩා සමාජයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෝෂ සහිතව පිළියෙල කරන ලද ආදායම් ප්‍රකාශය පහත දක්වේ.

Past Papers Wiki

ආදායම් ප්‍රකාශය

ආදායම්		
සාමාජික ගාස්තු	36,000	
පරිත්‍යාග ලැබීම්	20,000	56,000
වියදම්		
ක්‍රීඩා උත්සව වියදම්	16,000	
ජල ගාස්තු	3,000	
ප්‍රවේශ පත්‍ර ආදායම්	20,000	(39,000)
ශුද්ධ ලාභය		17,000

අමතර තොරතුරු,

1. මෙම ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් ගණන 20කි.
2. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 400කි.
3. රු. 10,000 කට මිලට ගෙන ඇති ක්‍රීඩා උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීමට තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ,

එක්සත් ක්‍රීඩා සමාජයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම.

(ලකුණු 04යි)

iii) කින්සිරිගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම් පහත දැක්වේ.

විස්තරය	හර (රු.)	බැර (රු.)
ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය)	145,000	
ලී බඩු උපකරණ (පිරිවැය)	90,000	
2025.12.31 දිනට ලී බඩු උපකරණ ක්ෂය වෙන් කිරීම		20,000
2025.12.31 දිනට බදු නොගය	21,000	
විකුණුම්		356,000
ගැනුම්	172,000	
ගෙවල් කුලී	16,000	
ණයගැතියෝ	21,000	
ණයහිමියෝ		32,000
ගෙන ඒමේ කුලී	28,000	
ලද වට්ටම්		4,500
10% බැංකු ණය මුදල		80,000
සේවක වැටුප්	28,000	
ප්‍රචාරණ	24,000	
බොල් ණය	1,000	
බැංකු ණය පොලී	5,000	
විදුලි ගාස්තු	12,000	
මූදල් ශේෂය	29,500	
ප්‍රාග්ධනය		100,000
	591,000	591,000

අමතර තොරතුරු:

1. 2025.12.31 දිනට ඉතිරි බදු නොගය රු. 22,000 කි.
2. වැටුප් රු. 2,000ක් 2025.12.31 දිනට ගෙවිය යුතුව ඇත.
3. ලී බඩු උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ,

අ) 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හා අලාභ ප්‍රකාශනය

ආ) 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(ලකුණු 08යි)

(මුළු ලකුණු 12යි)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

වර්ෂ අවසාන ඇගයීම - 2026

11 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය

I කොටස

(1)	-	3	(11)	-	2	(21)	-	3	(31)	-	3
(2)	-	1	(12)	-	4	(22)	-	4	(32)	-	3
(3)	-	4	(13)	-	3	(23)	-	3	(33)	-	3
(4)	-	4	(14)	-	2	(24)	-	1	(34)	-	3
(5)	-	1	(15)	-	1	(25)	-	3	(35)	-	4
(6)	-	4	(16)	-	4	(26)	-	2	(36)	-	3
(7)	-	4	(17)	-	3	(27)	-	3	(37)	-	1
(8)	-	4	(18)	-	4	(28)	-	1	(38)	-	2
(9)	-	3	(19)	-	2	(29)	-	2	(39)	-	1
(10)	-	2	(20)	-	4	(30)	-	3	(40)	-	2

(ලකුණු 1 x 40 = 40)

II කොටස

පිළිතුරු

01) i) අ) ඇඳුම් (ලකුණු 01)

ආ) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි. (ලකුණු 01)

ii) අ) ගනුදෙනුකරුවෝ / සැපයුම්කරුවෝ / බැංකු මූල්‍ය ආයතන (ලකුණු 1/2 x 2 = 1)

ආ) හෝටල් කිහිපයකට අලෙවිය සඳහා හිස්වැසුම්, මුදල් පසුම්බි, බෑග් ඉදිරිපත් කරන ලදී. (ලකුණු 01)

iii) අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.

ආ) සේවක සංඛ්‍යාව 25කට අඩු වීම. (ලකුණු 1 x 2 = 2)

iv) අ) පාලනය

ආ) සැලසුම් කළ පරිදි ගුණත්වයෙන් යුත් නිෂ්පාදිත බිහි වන්නේ දැයි අක්ෂි හා අමාෂි නිතරම සොයා බැලීය.

(ලකුණු 1 x 2 = 2)

v) අ) බැංකු ගිණුම හර - 100,000

මුදල් ගිණුම බැර - 100,000

ආ)

පොදු ජ'නලය

දිනය	ජ. අං	විස්තරය	ස.පි.	හර	බැර
		යන්ත්‍ර ක්ෂය ගිණුම හර		2,000	
		යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම			2,000
		(යන්ත්‍ර ක්ෂය සටහන් කිරීමකි.)			

(ලකුණු 1 x 2 = 2)

vi)

මුදල් පොත

ප්‍රාග්ධනය	1,000,000	බැංකු	100,000
විකුණුම් ආදායම්	600,000	ගැනුම්	150,000
		වැටුප්	60,000
		ප්‍රවාහන	40,000
		විදුලිය	5,000
		අනෙකුත් සේවා	2,000
		ශේෂය ප/ගෙ	1,243,000
	1,600,000		**1,600,000**
ශේෂය ඉ/ගෙ	1,243,000		

ඉහත පිළිතුර සඳහා බැංකු ණය ලබා ගෙන ඇත්තේ 2026.02.01 දින බැවින් එය ඇතුළත් නොවේ.

vii) අ) පොදු ජ'නලය

ආ) විදුලි වියදම් ගිණුම හර - 2,000

උපචිත විදුලි වියදම් ගිණුම බැර - 2,000 (ලකුණු 1 x 2 = 2)

viii) අ) යන්ත්‍ර (200,000 - 2,000) = 180,000

ආ) ලදුපත, වවුචරය

ජර්නල් වවුචරය (ලකුණු 1 x 2 = 2)

ix)

ලාභ හෝ අලාභ ප්‍රකාශය

ආදායම්		600,000
ගැනුම්	150,000	(150,000)
දළ ලාභය		450,000
+ ආදායම්		
- වියදම්		
යන්ත්‍ර ක්ෂය	2,000	
විදුලිය	7,000	
වැටුප්	60,000	
ප්‍රවාහනය	40,000	
අනෙකුත් සේවා	2,000	(110,000)
ශුද්ධ ලාභය		**340,000**

(ලකුණු 02)

x) අ) 1/31 හිමිකම = 1/1 ප්‍රාග්ධනය + ශු. ලාභය

= 1,000,000 + 340,000

= 1,340,000

ආ) වියදම්

ගැනිලි

02) i) අ) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.

ආ)
- ලාභ ඉපැයීම
- පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
- භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීම
- රැකියා උත්පාදනය

ii) අ) අසත්‍ය ය. ආ) සත්‍ය ය. ඉ) සත්‍ය ය. ඊ) අසත්‍ය ය.

iii) අ) භාණ්ඩ හා සේවා අලෙවියේ දී තීරණය වන පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම උද්ධමනයයි.

ආ) ◆ නවීන තාක්ෂණය ලබා ගත හැකි වීම.
◆ ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම.
◆ කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබා ගත හැකි වීම.

iv) අ) ප්‍රධාන පාසල් කිහිපයක් අසල ව්‍යාපාරය ආරම්භ කිරීම.
ආ) ◆ ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැති වීම.
◆ පුහුණු සේවකයන්ගේ හිඟය

03) i) අ) ව්‍යාපාරයක් සාර්ථක ලෙස පවත්වාගෙන යාම සඳහා සහය වන විවිධ සේවා, උපකාරක සේවා වේ.
ආ) ◆ නැවත විකිණීමේ අරමුණ
◆ විශාල භාණ්ඩ ප්‍රමාණයක් එකවර විකිණීම.
◆ භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් අලෙවි කිරීම.
◆ සාපේක්ෂව ඒකකයක විකුණුම් මිල අඩු වීම.

ii) අ) සත්‍ය ය. ආ) අසත්‍ය ය. ඉ) සත්‍ය ය. ඊ) සත්‍ය ය.

iii) අ) චෙක්පතේ මුහුණත සඳහන් ආදායකයාගේ නම ඒ ආකාරයටම ඔහුගේ ම අත් අකුරින් චෙක්පත පිටුපස ලිවීම, චෙක්පත පිටසන් කිරීමයි.
ආ) ◆ චෙක්පතහි ඉලක්කමෙන් හා අකුරින් සඳහන් වටිනාකම වෙනස් වීම.
◆ බැංකු ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොමැති වීම.
◆ අණකරුගේ අත්සන ආදර්ශ අත්සනට වෙනස් වීම.

iv) අ) ◆ භාණ්ඩයේ ස්වභාවය ◆ පිරිවැය ◆ ධාරිතාව ◆ ආරක්ෂාව
ආ) ◆ දත්ත විනාශ වීමේ අවදානමක් පැවතීම.
◆ අමතර පිරිවැයක් දැරීමට සිදුවීම.

04) i) අ) රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන කෙටිකාලීන සුරැකුම්පත් වර්ගයකි.
ආ) ◆ මිලදී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම.
◆ ගත් මිලට වඩා වැඩි මිලකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයාගත හැකිවීම.
◆ ණය ලබා ගැනීමේ දී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකිවීම.

ii) අ) අසත්‍ය ය. ආ) අසත්‍ය ය. ඉ) සත්‍ය ය. ඊ) සත්‍ය ය.

iii) A - සංවිධානකරණය B - සැලසුම්කරණය
C - පාලනය D - මෙහෙයවීම

iv) අ) ◆ සාමාන්‍ය කොටස්වල ආයෝජනය
◆ ස්ථාවර වත්කම්වල ආයෝජනය (උදාහරණ වුවද කම් නැත)
ආ) නැත.
ජංගම ගිණුමක මුදල් තැන්පත් කිරීමට පොළී නොලැබෙන නිසා

05) i) අ) අයිතිකරුවන්, කළමනාකරුවන්, ණයහිමියන්, සේවකයන්, රජය (ලකුණු 1/2 x 2 = 1)
ආ) - රු. 5,000ක් ණයගැතියන්ගෙන් ලැබීම.
- රු. 2,000 තොගයක් මිලදී ගැනීම.
- රු. 5,000ක කාර්යාල උපකරණ ලබාගැනීම (ලකුණු 01)

ii) අ) මුදල් ගිණුම හර 200,000
බැංකු ණය ගිණුම බැර 200,000 (ලකුණු 01)

ආ) ණයගැති චාමර ගිණුම හර 5,000
විකුණුම් බැර 5,000 (ලකුණු 01)
(වටිනාකම් නොමැති නම් ලකුණු 1ක් අඩු කරන්න.)

iii) අ) 1. රු. 12,000ක තොගයක් ණයට ගැනීම.
2. රු. 8,000ක බැංකු ණය හා රු. 1,000ක පොලිය ඇතුළත් රු. 9,000ක බැංකු ණය වාරිකය ගෙවීම.
3. රු. 10,000ක ණයගැතියන්ගෙන් රු. 2,000ක වට්ටමකට යටත්ව රු. 8,000ක මුදලක් ලැබීම.
4. රු. 5,000ක පිරිවැය වූ තොගයක් රු. 7,500ට අත්පිට මුදලට විකිණීම. (ලකුණු 1/2 x 4 = 2)

ආ) 1 ආරම්භක හිමිකම 107,000

වත්කම්	වගකීම්
200,000	150,000
20,000	31,000
40,000	
28,000	
288,000	181,000

2. A - තොගය 27,000 + ණයගැති 30,000 + මුදල් 34,500 = 91,500
B - බැංකු ගිණුම - 142,000
C - හිමිකම - 106,500 (ලකුණු 1/2 x 4 = 2)

iv)

දිනය	ඉන්වොයිස් අංකය	සැපයුම්කරු	මුළු වටිනාකම	ලොරි
05/03	05/02	අමල් ව්‍යාපාරය	3,000	
05/15	08/08	ජාලිය ව්‍යාපාරය	3,500	
05/31		ගැනුම් ගිණුමට හර කලා	6,500	

ගැනුම් ගිණුම

දිනය	විස්තරය	ස/පි	වටිනාකම	දිනය	විස්තරය	ස/පි	වටිනාකම
05/31	ණයහිමි ගිණුම		6,500				

(1/2)

ණයහිමි - අමල්

දිනය	විස්තරය	ස/පි	වටිනාකම	දිනය	විස්තරය	ස/පි	වටිනාකම
				05/12	ගැනුම් ගිණුම		3,000

(1/2)

ණයහිමි - ජාලීය ව්‍යාපාරය

දිනය	විස්තරය	ස/පි	වටිනාකම	දිනය	විස්තරය	ස/පි	වටිනාකම
				05/15	ගැනුම් ගිණුම		3,500

(1/2)

(නිවැරදි ආකෘතිය සහිත ගිණුම තුනට (1/2) (ලකුණු 04යි)

06) i) අ) මුලික පොත්වල ගනුදෙනු ඇතුළත් කිරීමේ දී
ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ දී
තුලජර ගිණුම් තුලනය කිරීමේ දී
ශේෂ පිරික්සුම සැකසීමේ දී (කරුණු 02කට ලකුණු)

ආ) ආදේශ භාණ්ඩවල මිල (කරුණු 02කට ලකුණු)

PAST PAPERS WIKI

ii) අ) මුළු නිෂ්පාදන පිරිවැය = 600,000
නිෂ්පාදන ඒකක 3,000
= 200 (ලකුණු 01යි)

ආ) සෘජු ශ්‍රම පිරිවැය = 150,000 (ලකුණු 01යි)

iii) අ)

සංශෝධිත බැංකු ගිණුම්

ශේෂය	1/2	100,000	රක්ෂණ වාරිකය	26,000	1/2
සෘජු ප්‍රේෂණ	1/2	26,000			
			ශේෂය ප/ගෙ	100,000	1/2
		126,000		126,000	
ශේෂය ඉ/ගෙ		100,000			

ආ)

බැංකු සැසඳුම් විස්තරය

	රු.	රු.	
බැංකු ප්‍රකාශයට අනුව ශේෂය		100,000	1/2
එකතු කළා:			
නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්			
A480	16,000		
A500	32,000	48,000	1/2
		148,000	
අඩු කළා:			
තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්			
B143	50,000		1/2
B139	28,000	(78,000)	
2025.09.30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය 1/2		70,000	

(ලකුණු 04යි)

iv) අ)

සිතුම්ගේ ව්‍යාපාරයේ
පොදු ජ'නලය

දිනය	ව.අ.	විස්තරය	ස.පි.	හර රු.	බැර රු.
		අවිනිශ්චිත ගිණුම හර		500	
		විකුණුම් ගිණුම			500
		(රු. 7,500ක විකුණුම් රු. 7,000ක් ලෙස පිටපත් වීම නිවැරදි කිරීමයි.)			
		දුරකථන ගාස්තු ගිණුම හර		3,000	
		අවිනිශ්චිත ගිණුම			3,000
		(දුරකථන ගාස්තු මුදල් පොතේ පමණක් සටහන් වීම නිවැරදි කිරීමයි.)			
		නිමල්ගේ ගිණුම හර		15,000	
		අමල්ගේ ගිණුම			15,000
		(අමල්ගෙන් ලද රු. 15,000ක මුදල නිමල්ගේ ගිණුමට සටහන් වීම නිවැරදි කිරීමයි.)			

ආ)

අවිනිශ්චිත ගිණුම

ඉ/ගෙ/ශේෂය	2,500	දුරකථන ගාස්තු	3,000
විකුණුම්	500		
	3,000		3,000

(ලකුණු 04යි)

Past Papers Wiki

07) i) ලැබීම් හා ගෙවීම් ගිණුම
ආදායම් ප්‍රකාශය (ලකුණු 02යි)

ii) **එක්සත් ක්‍රීඩා සමාජයේ**
2025.12.31 ආදායම් ප්‍රකාශය

ආදායම්		
සාමාජික මුදල්	8,000 (1/2)	
පරිත්‍යාග ලැබීම්	20,000	
ප්‍රවේශ පත්‍ර ආදායම්	20,000 (1/2)	48,000
වියදම්		
ක්‍රීඩා උපකරණ ක්ෂය	1,000 (1/2)	
ක්‍රීඩා උත්සව වියදම්	16,000	
ජලබිල් ගාස්තු	3,000	(20,000) (1/2)
අතිරික්තය		100,000

(ලකුණු 02යි)

iii) අ) **කිත්සිරිගේ ව්‍යාපාරයේ**
2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (1/2)

	රු.	රු.	රු.
විකුණුම්			356,000
අඩු කළා - විකුණුම් පිරිවැය			
ආරම්භක තොගය		21,000	
ගැනුම්		172,000	
ගෙනඒමේ කුලී		28,000	
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය		221,000	
අඩු කළා - අවසාන තොගය		(22,000) (1/2)	
විකුණුම් පිරිවැය			(199,000) (1/2)
දළ ලාභය			157,000 (1/2)
එකතු කළා - වෙනත් ආදායම්			
ලද වට්ටම්			4,500
			161,500
අඩු කළා - වියදම්			
බෙදා හැරීමේ වියදම්			
ප්‍රචාරණය	24,000		
බොල් ණය	1,000	25,000	
පරිපාලන වියදම්			
සේවක වැටුප්	30,000 (1/2)		
ලී බඩු ක්ෂය	9,000 (1/2)		
ගෙවල් කුලී	16,000		
විදුලි ගාස්තු	12,000	67,000	
මූල්‍ය වියදම්			
බැංකු ණය පොලි	8,000 (1/2)	8,000	(100,000)
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා			61,500 (1/2)

(ලකුණු 04යි)

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ආ)

කිත්සිරිගේ ව්‍යාපාරයේ

2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (1/2) (1/2)

	පිරිවැය රු.	සමුච්චිත රු.	ධාරණ රු.
ජංගම නොවන වත්කම්			
ලී බඩු උපකරණ	90,000	(29,000) (1/2)	61,000
ඉඩම් හා ගොඩනැගිලි	145,000	-	145,000
	235,000	29,000	206,000 (1/2)
ජංගම වත්කම්			
අවසාන තොගය		22,000 (1/2)	
ණයගැතියෝ		21,000	
මුදල්		29,500	72,500
මුළු වත්කම්			278,500
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය		100,000	
එකතු කළා - ශුද්ධ ලාභය		61,500 (1/2)	
			161,500
ජංගම නොවන වත්කම්			
10% බැංකු ණය			80,000
ජංගම වගකීම්			
උපචිත වැටුප්		2,000 (1/2)	
උපචිත බැංකු ණය පොලී		3,000 (1/2)	
ණයහිමියෝ		32,000	37,000
මුළු හිමිකම් හා වගකීම්			278,500

(ලකුණු 04යි)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library